# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1819/44 - 2013 ජූලි මස 19 වැනි සිකුරාදා - 2013.07.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවා ව්‍යවස්ථා සංග්‍රහය

2013 අප්‍රේල් මස 05 වන සිකුරාදා දින අංක 1804/50 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළවූ ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවා ව්‍යවස්ථා සංග්‍රහය පිළිබඳ ගැසට් නිවේදනයේ පහත සඳහන් සංශෝධනයන් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබ ඇත.

*ඡේද අංකය* — *යෝජිත සංශෝධනය*

19.3 (i) ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මකවීමට පෙර පැවති සේවා ව්‍යවස්ථාව යටතේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ, II වැනි පන්තියේ I වැනි ශ්‍රේණියේ හා මෙම සේවා ව්‍යවස්ථාව යටතේ II වැනි ශ්‍රේණියේ සේවා කාලයන්ගේ එකතුව වසර 13ක් සම්පූර්ණ කර තිබීම. එම සේවා කාලයට II වැනි ශ්‍රේණියේ වසර තුන (03) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් ඇතුළත් විය යුතුය.

*සංලක්ෂ්‍යය :*

මෙහි II වැනි ශ්‍රේණියේ වසර තුන (03) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් යන්නට

(1) පෙර පැවති සේවා ව්‍යවස්ථාවේ II වැනි පන්තියේ I වැනි ශ්‍රේණියේ වසර තුන (03) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් හෝ

(2) නව සේවා ව්‍යවස්ථාවේ II වැනි ශ්‍රේණියේ වසර තුන (03) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් හෝ

(3) ඉහත (1) හා (2)හි එකතුව වසර තුන (03)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක්

යන්න සලකනු ලැබේ.

19.3 (ii) මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මකවීමට පෙර පැවති සේවා ව්‍යවස්ථාවේ සඳහන් ප්‍රථම හා දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණ සමත් වී තිබීම.

1A - G 018000 — 320 (2013/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

19.4හි සටහන : ඉහත 19.4 ඡේදයේ සඳහන් විධිවිධාන අනුව අන්තර්කාලීන විධිවිධාන යටතේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ II-II ශ්‍රේණියේ සිට ඉහළ ශ්‍රේණිවල අවුරුදු විසිපහ (25)ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධරයන් ඒ සඳහා 11.3.1 (i) වගන්තිය මගින් නියම කර ඇති පශ්චාත් උපාධියක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. මෙම සහනය 2012.10.01 දින සිට 2015.12.31 දින දක්වා බල පැවැත්වේ.

2016.01.01 දින සිට 2018.01.01 දින දක්වා කාලය තුල ඇතිවන විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩුවලට උසස් කිරීමේදී මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන තීරක මණ්ඩලයක් විසින් පිළිගනු ලබන ලිඛිත නිබන්ධනයක් ඉදිරිපත් කරන නිලධරයන් 11.3.1 (i) වගන්තියෙහි නියම කර ඇති පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ටී. එම්. එල්. සී. සේනාරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2013 ජූලි මස 19 දින.

08 - 219

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.